# සුරංගනා ලොවේ රැජිනියන් ෆේරා සහ බෙලා



ඩී.එම් සහේළි සාවිද්‍යා දීගල

ග්‍රන්ථ නාමය :- සුරංගනා ලොවේ රැජිනියන්

ෆෝරා සහ බෙලා

කතාව පිටකවරය හා චිත්‍ර :- ඩී.එම් සහේළි සාවිද්‍යා දීගල

කතෘගේ වෙනත් කෘති :-

* හා පවුල
* අපි හොඳම යාළුවෝ

මෙම කෘතියෙහි සියලුම අයිතිය කතෘ සතුය...

ප්‍රකාශය හා පළමු මුද්‍රණය :- 2025 පෙබරවාරි 08

ISBN අංකය :- 978-624-208-755-9

# <u>පිදුම</u>

මාගේ ලේඛන කුසලතාව වර්ධනය කර ගැනීම සඳහා මඟ පෙන්වූ මහාමායා විදුහලේ 5 - B පන්තියේ එරන්ද පද්මකුමාර ගුරු පියාණන්ට හා මා ආදරණීය දෙමව්පියන් ඇතුළු පවුලේ සැමටත් , ග්‍රන්ථය නිමා කර ගැනීමට සහාය දුන් සියළුම දෙනාටත් සැකසූ මෙම ග්‍රන්ථය පිළිගන්වමි.

ඩී.එම්. සහේළි සාවිද්‍යා දීගල

5 ශ්‍රේණිය B

මහාමායා බාලිකා විදුහල,

මහනුවර.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණියුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "**හෙරණගත්කරණී**" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක කාලයක අහසේ ලස්සන සුරංගනා ලෝකයක් තිබුණා. සුරංගනා ලෝකෙ හැම කෙනෙක්ම සුරංගනාවියෝ. එයාලා හරිම ලස්සනයි. එයාලාට විවිධ බලයන් තියෙනවා. ඒ අයට මෙන්න මේ වගේ බල තමයි තියෙන්නේ. ගස් වැල් වවන්න, මිනිසුන්ට සාමය සමඟිය බෙදන්න, සතුන්ට කථා කරන්න පුළුවන් සහ පොළොවට වැසි වස්සවන්න. මේ සුරංගනා ලෝකයේ රැජින තමයි හැනා.  හැනා රැජිනියත් හරිම ලස්සනයි.



හැනා රැජිනියට හිටියා ලස්සන දූවරුන් දෙදෙනෙක්. මෙයාලා නිවුන්නු. එක දුවෙකුගේ නම බෙලා අනෙක් දුවගේ නම ෆෝරා. මේ දෙන්නම හරිම ලස්සනයි වගේම එකමුතුයි. දෙන්නම පාඩම් වැඩවලට දක්ෂයි. ඒ වගේම හැමෝටම උදවු කරනවා වගේම කරුණාවන්තයි. එක දවසක් රැජින බෙලාටයි, ෆෝරාටයි රැජිනගේ කාමරයට එන්න කිව්වා.



බෙලා සහ ෆෝරා රැජිනියගේ කාමරයට ගියා. "ඇයි අම්මේ අපිට කතා කරේ ?". "බෙලා.. ෆෝරා.. මට දැන් තවමත් රැජිනක් වෙලා ඉන්න බෑ. මගේ කාලය ඉවර වෙන්න ළඟයි. මම මේ තනතුරෙන් ගියාම ඔය දෙන්නා තමයි රැජිනියන්.." කියලා හැනා රැජිනිය කිව්වා.

"බෙලා, ෆෝරා හැම රැජිනියකටම මේ පරීක්ෂණය කරන්න ඕනේ. මෙන්න මෙහෙමයි කරන්නේ ඔය දෙන්නා අපේ කැලේ මැදින් ගිහින් රහස් ගුහාව හොයාගෙන ඒක ඇතුළේ ඉන්න කෙනාව පරද්දලා එයාගේ අතේ තියෙන රතු මැණික අරගෙන එන්න ඕනේ... දැන් ඔයාලාට යන්න පුළුවන්. හවස 6ට කලින් එන්න ඕන තේරුණාද?"

" හරි අම්මේ.. ස්තූතියි". බෙලා සහ ෆෝරා කිව්වා.

"අපි ඒක ජයගන්නවා" හිතමින් දෙන්නම තමන්ගේ කාමරයට ගියා.

බෙලා හිතුවා නංගිව පරාද කරලා තමන් දිනන්නට.

කුමාරිකාවන් දෙදෙනාම උදේ පාන්දරින් අවදි වුණා. තමන්ට අවශ්‍ය ද්‍රව්‍ය ටික ගමන් මලුවලට දාගත්තා.

දෙන්නම දැන් කැලේ මැදින් යන්න පටන් ගත්තා. එක පාරටම බෙලාගේ කකුලේ කටු වැලක් එතුනා. බෙලා හයියෙන් කෑගහන්න පටන් ගත්තා. මේ කෑගැහිල්ල ඇහුණු ෆෝරා, බෙලා පැටලිලා හිටපු කටු වැල  දැක්කා. ෆෝරා ගහක තිබුණු ලොකු හයිය කෝටුවක් කඩා ගත්තා. ඒ කෝටුවෙන් බෙලාගේ කකුලේ තිබුණු කටු වැල ඉවත් කළා. බෙලාගේ කකුලෙන් ලේ ගලන්න පටන් ගත්තා.



ෆෝරා ඖෂධ පැළෑටියක් ගෙන පොඩි කළා. ඊට පස්සේ බෙලාගේ කකුලේ සීරුණු තැන්වල ඒ පැළෑටිය ගෑවා. ඊට පස්සේ ලේ ගලන එක නැවතුනා. කැලේ මැදින් යනකොට බෙලාට, ෆෝරා ගැන දුක හිතුණා. “ෆෝරාට තිබුණා මාව තනිකරලා යන්න.. ඒත් එයා මට උදව් කළා”. බෙලාට එහෙම හිතුණා. බෙලාට තේරුණා එයා කරන්න ගියේ වැරදි දෙයක් කියලා.



අන්තිමට බෙලා ෆෝරාට ස්තූති කළා. “ස්තූති කරන්න එපා. අපි සහෝදරියෝනේ..” ෆෝරා බෙලාට කිව්වා. ටික දුරක් යනකොට පාරවල් දෙකක් හම්බවුණා. ඒ පාරවල් දෙක අතරේ දැන්වීමක් තිබුණා.

මෙහෙ එක පාරක ගියොත් එන්න වෙන්නෙ නෑ.

එක පාරක් හරිම පිරිසිදුව තිබුණා. අනික් පාරේ කටුවැල් තිබුණා. බෙලා කිව්වා “අපි කටුවැල් තියෙන පාරේ  යමු” කියා.



ෆෝරා ඒකට එකඟ වුණා. ඒ දෙන්නම කටුවැල් වලින් බේරිලා ගියා. අන්තිමට ඒ දෙන්නාට හම්බ වුණා විශාල ගල් ගුහාවක්. බෙලයි ෆෝරායි ගල් ගුහාව ඇතුළට ගියා. ඒ දෙන්නා ටිකක් ඉස්සරහට යනකොට ලොකු ඔලු තුනේ බල්ලෙක් දැක්කා. ඒ ඔලු තුනේ බල්ලාගේ පිටිපස්සේ රතු මැණික.



බෙලයි ෆෝරායි එකමුතුවෙන් ඔලු තුනේ බල්ලව පරාද කරා. රතු මැණිකත් ගත්තා.  ඒ ගොල්ලෝ මාලිගාවට එද්දී හැම සුරංගනාවියක්ම බෙලයි ෆෝරායි පිළිගත්තා. බෙලයි ෆෝරායි හැනා රැජීනියට හැම දෙයක්ම කිව්වා. හැනා රැජීනිය බෙලාටයි ෆෝරාටයි මෙහෙම කිව්වා. “ මට ඔය දෙන්නා ගැන හරිම ආඩම්බරයි. දැන් ඔයාලා ගිහින් විවේක ගන්න”. “හරි අම්මේ..”



බෙලායි ෆෝරායි නැඟිටලා මුහුණ හෝදලා රාජධානියට ගියා. මාළිඟාවට ගියාට පස්සේ හැනා රැජිනියට රතු මැණික දුන්නා. හැනා රැජින කතාවක් කළා. ඊට පස්සේ බෙලායි ෆෝරායි කතාවක් කළා. බෙලාටයි ෆෝරාටයි ඔටුනු පැළඳුවා. සුරංගනාවියෝ ප්‍රීති ඝෝෂා නැගුවා. ඊට පස්සේ සුරංගනාවියෝ සාමයෙන් සමඟියෙන් ජීවත් වුණා.



නිමි.



## <u>පසුවදන</u>

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්